# සද්ධර්මරත්නාවලියෙන් නිරූපිත සමකාලීන ජනවහර හා අද්‍යතන ගැමි ජනවහර අතර ඇති සමීපතාව පිළිබඳ විමසුමක්

ජයතිලක ආර්.ජේ.ටී.එම්.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
thilinamjayathilaka@gmail.com

**සාරසංක්ෂේපය**

සද්ධර්මරත්නාවලියෙන් නිරූපිත සමකාලීන ජනවහර හා අද්‍යතන ගැමි ජනවහර අතර ඇති සමීපතාව පිළිබඳ විමසුමක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. සද්ධර්මරත්නාවලියෙන් නිරූපිත ජන බස් වහරෙහි වත්මන් භාවිතාව කෙබඳුද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. දඹදෙණි යුගයේ ජන බස් වහරේ ස්වභාවය හඳුනා ගැනීම, ඒවායේ වත්මන් භාවිතාව පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනය මෙහි අරමුණු වේ. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සිදු කරන අතර එයින් ලබා ගන්නා දත්ත තුලනාත්මකව හා සන්සන්දනාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹී ඇත. පුරාණ ගැමි බැවහරයන් කලානුරූපීව සමාජය විසින්ම පවත්වාගෙන ආ බව සද්ධර්ම රත්නාවලියෙහි භාෂාව පිරික්සීමේදී ගම්‍යමාන වේ. "කියන්නට ම සිතා ආ <u>ගමනේ</u>..." යනුවෙන් කෘතිගත පාඨයෙහි 'ගමනේ' යන්නෙන් කියැවෙන්නේ කාලය පිළිබඳවයි. 'ආපු ගමන්', 'මේ ගමන' ආදි ලෙස නූතන ගැමියා කාලවාචී ස්වරූපයෙන් එය භාවිත කරයි. "මැණික් තිබියදී තිරිවාන <u>පොඩි</u> ගන්නා සේ..." යන වදනේ 'පොඩි' යනු කුඩා යන්නයි. එම විශේෂණය 'රියම් පොඩි', 'වළං පොඩි', 'තන පොඩි' වශයෙන් නූතනයේ යෙදේ. "සිඟා යන වේලේ <u>එක්තැන්</u> වම්භ..." යනුවෙන් යෙදෙන තැන 'එක්තැන්' යන්නෙන් 'ඔත්පොළ වීම' අර්ථවත් වන අතර එය එලෙසින්ම නූතනයේ භාවිත වේ. "<u>කෙලි කොල්ලන්</u> පිරිවරා හවස්<u>මාන</u> වෙහෙරට අවුත්..." යන්නෙහි 'කෙලි කොල්ලන්' අද ජන වහරෙහි පැනෙන්නේ 'කෙල්ලන්-කොල්ලන්' ලෙසය. නමුත් හුදකලාව යෙදුනොත් 'කෙලී' යනුවෙන් භාවිත වේ. 'හැන්දෑමානයේ', 'එළිවුණුමානයේ' වශයෙන් 'මාන' යන්න භාවිත වේ. "බත් හැන්ද <u>පිටලා</u>..." යන්නෙහි 'පිටලා' යන වචනය හිලව්වට, වෙනුවට යන අර්ථය දෙයි. 'ලෙඩ පිටලා හැමදාම ගෙදර ඉන්නවා' යනු එහි නූතන භාවිතයට නිදසුනකි. "ගෙවල් <u>අත්ගානා</u> සොරු..." යන යෙදුමෙහි 'අත්ගානා' යන්නෙන් 'සොරකම් කිරීම' නිරූපිතය. වත්මනේ එය 'අතගාගෙන ගිහින්' වශයෙන් යෙදේ. තවද කෘතියේ එන "රජගහ නුවර <u>ගාවා</u>..." වදනේ 'ගාවා' යන්න 'ගාව' ලෙසත්, "<u>හඬගානා</u> කෙනෙක්..." වදනේ 'හඬගානා' යන්න 'අඬගහන' ලෙසත්, "බොහෝ රළ <u>නිම්මනයක් නැතිව</u>..." වදනේ 'නිම්මනයක් නැතිව' යන්න 'නිම්මාවක් නැතිව' ලෙසත් නූතන ජන වහරේ භාවිත වේ. එසේම "අප්පිඩි" යන්න 'අප්පුඩි' ලෙසත් " හස්සට" යන්න 'අස්සට' ලෙසත් "කෙටි" යන්න 'කොට' ලෙසත් "පාන්දඩ" යන්න 'පාන්දර' ලෙසත් භාවිත වේ. මේ අනුව දඹදෙණි යුගයේදී රචිත සද්ධර්මරත්නාවලිය මගින් සමකාලීන ජන බස්වහර සහ එහි ස්වභාවය පිළිබඳව බොහෝ තොරතුරු ලබා ගත හැකි අතර එම බස්වහර හුදෙක් නූතන සමාජයෙහි අඩුවැඩි වශයෙන් හෝ යම් සමානත්වයක් සහිතව හෝ ක්‍රියාත්මක වන ස්වභාවයක් දැකිය හැකි බව නිගමනය කළ හැකි වේ.

**ප්‍රමුඛ පද:** *පොඩි, එක්තැන්, හඬගානා, අප්පිඩි, පාන්දඩ*